සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA2 විභාගය - 2016 ජූලි

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය

(Advanced Financial Accounting)

2016-07-16
පෙරවරු
[8.45 – 12.00]

පිටු ගණන : 10
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):
  - (1) ***දී ඇති කාලය :*** *කියවීම සඳහා - විනාඩි 15 යි.*
    *උත්තර ලිවීම සඳහා - පැය 03 යි.*
  - (2) ***සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයිය යුතු වේ.***
  - (3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*
  - (4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*
  - (5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*
  - (6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*
  - (7) *ලකුණු 100 යි.*

---

## A කොටස

### වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න (OTQs)

අනිවාර්යය ප්‍රශ්න අට (08) කි.

(මුළු ලකුණු 20)

### **01** වන ප්‍රශ්නය

*අංක 1.1 සිට 1.3 දක්වා ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම සුදුසු උත්තරය තෝරන්න. තෝරාගත් උත්තරයට අදාල අංකය ප්‍රශ්න අංකය සමග ඔබේ උත්තර පොතේ ලියන්න.*

**1.1** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - 10 (LKAS 10) වාර්තාකරන කාලච්ඡේදයට පසු සිදුවීම් අනුව, වාර්තාකරන කාලච්ඡේදයට පසු නොගලපන සිදුවීම් (non-adjusting events) ලෙස සලකනු ලබන්නේ, පහත සඳහන් කුමන සිදුවීම් ද?

**(a)** වාර්තාකරන කාලච්ඡේදයට පසු ප්‍රකාශිත ලාභාංශ.

**(b)** වාර්තාකරන කාලච්ඡේදයට පසු ප්‍රධාන නිෂ්පාදන පිරියතයක් ගින්නෙන් විනාශ වීම.

(1) **(a)** පමණි. (2) **(b)** පමණි.

(3) **(a)** සහ **(b)** යන දෙකම. (4) ඉහත සඳහන් කිසිවක් නොවේ. (ලකුණු 02)

**1.2** සීමාසහිත **X සමාගමේ** 2016 ජූනි මාසයේ වැටුප් ලේඛනයෙන් (payroll), පහත සඳහන් තොරතුරු උපුටාගන්නා ලදී:

| | **රු.** |
|---|---|
| සේවකයන්ගේ දළ වැටුප් | 575,000 |
| වැටුප් වලින් අඩුකරගත් ණය වාරික | 75,000 |
| සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේව්‍යයාගේ දායකය | 69,000 |
| සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේවකයන්ගේ දායකය | 46,000 |
| සේවක භාර අරමුදලට (ETF) සේව්‍යයාගේ දායකය | 17,250 |
| සේවකයන්ගෙන් අඩුකර ගත් උපයන විට ගෙවන බදු (PAYE) | 20,000 |

2016 ජූනි මාසය සඳහා සේවකයන්ට ගෙවිය යුතු ශුද්ධ වැටුප් වන්නේ:

(1) රු.434,000/- කි. (2) රු.416,750/- කි. (3) රු.347,750/- කි. (4) රු.454,000/- කි.

(ලකුණු 02)

**1.3** තනි පුද්ගල (කේවලස්වාමි) ව්‍යාපාරයක 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සඳහන් තොරතුරු ඔබ වෙත සපයා ඇත:

| | **රු.** |
|---|---|
| 2015 අප්‍රේල් 01 දිනට ප්‍රාග්ධනය | 250,000 |
| වර්ෂය තුළ යෙදවූ අමතර ප්‍රාග්ධනය | 50,000 |
| වර්ෂය තුළ ගැනිලි | 30,000 |
| 2016 මාර්තු 31 දිනට ප්‍රාග්ධනය | 400,000 |

2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපාරයේ ලාභය වන්නේ:

(1) රු.70,000/- කි. (2) රු.130,000/- කි. (3) රු.270,000/- කි. (4) රු.230,000/- කි.

(ලකුණු 02)

*අංක 1.4 සිට 1.8 දක්වා ප්‍රශ්න වලට නිවැරදි උත්තර, ප්‍රශ්න අංකය සමග උත්තර පොතේ ලියන්න.*

**1.4** හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය ඇගයීම් කර ගිණුම් පොත්වල ගැලපීම් කළ යුතු අවස්ථා දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

**1.5** හවුල් ව්‍යාපාරයක කීර්තිනාමය අගය කිරීමේ ක්‍රම දෙකක්(02) සඳහන් කරන්න. (ලකුණු 02)

**1.6** 1890 හවුල්ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියේ (section 24) විධිවිධාන (provisions) තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.7** වගකීම සීමාසහිත සමාගමක ලක්ෂණ තුනක්(03) සඳහන් කරන්න. (ලකුණු 03)

**1.8** සමාගමක් ***x*** නමැති නිෂ්පාදිතය විකිණීමේ ව්‍යාපාරයක යෙදී සිටී. 2016 අප්‍රේල් 01 දිනට, එකක් රු.190,000/- බැගින් අගය කර තිබූ ***x*** නිෂ්පාදිතයේ ඒකක 700 ක් එහි තොගයේ තිබූ අතර, තොග ඇගයීම සඳහා සමාගම ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු (FIFO) ක්‍රමය භාවිත කර ඇත. 2016 අප්‍රේල් මාසය සඳහා පහත සඳහන් ගනුදෙනු උපුටාගෙන තිබේ:

| **දිනය** | **විස්තරය** | **ඒකක** | **ඒකකයක මිල (රු.'000)** |
|---|---|---|---|
| 2016 අප්‍රේල් 11 | මිලදී ගැනුම් | 400 | 225 |
| 2016 අප්‍රේල් 15 | විකුණුම් | 750 | 320 |

2016 අප්‍රේල් මාසය සඳහා දළ ලාභය ගණනය කරන්න. (ලකුණු 04)

*A කොටසෙහි අවසානය*

## B කොටස

අනිවාර්යය ප්‍රශ්න පහ (05) කි.

(මුළු ලකුණු 25)

### 02 වන ප්‍රශ්නය

2016 මාර්තු 31 දිනට **සීමාසහිත වින්ඩ් හයි ටී සමාගමේ,** බැංකු ප්‍රකාශනයේ ශේෂය, මුදල් පොතේ බැංකු තීරුවේ තිබූ රු.107,000/- ක හර ශේෂය සමග එකඟ වූයේ නැත. එම දිනයේ බැංකු ප්‍රකාශනයේ රු.227,000/- ක වාසිදායක ශේෂයක් පෙන්නුම් කරන ලදී.

වෙනසට හේතු වූ පහත සඳහන් කරුණු පසුව අනාවරණය විය.

(1) පහත දැක්වෙන නිකුත් කළ චෙක්පත් 2016 මාර්තු 31 දිනට ගෙවීම සඳහා බැංකුව වෙත ඉදිරිපත් කර නොතිබුණි:

| චෙක්පත් අංකය | නිකුත්කළ දිනය | වටිනාකම, රු. |
|---|---|---|
| 750298 | 2016.03.25 | 5,500 |
| 750307 | 2016.03.28 | 70,000 |
| 750136 | 2016.03.30 | 83,000 |

(2) පහත සඳහන් තැන්පත් කරන ලද චෙක්පත 2016 මාර්තු මාසය තුළදී උපලබ්ධි වී නොතිබුණි:

| චෙක්පත් අංකය | තැන්පත් කළ දිනය | වටිනාකම, රු. |
|---|---|---|
| 345675 | 2016.03.30 | 25,000 |

(3) 2016 මාර්තු 30 දින බැංකුව විසින් වැරදීමකින් රු.11,000/- ක් **සීමාසහිත වින්ඩ් හයි ටී සමාගමේ** බැංකු ගිණුමට හරකර තිබුණේය.

(4) 2016 මාර්තු මාසය සඳහා බැංකුව විසින් අයකරන ලද රු.2,500/- ක බැංකු ගාස්තුව මුදල් පොතේ සටහන් කර නොතිබුණි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

**සීමාසහිත වින්ඩ් හයි ටී සමාගම** සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2016 මාර්තු 31 දිනට ගලපන ලද මුදල් පොත.

(b) 2016 මාර්තු 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශය. (ලකුණු 05)

### 03 වන ප්‍රශ්නය

ලිපිද්‍රව්‍ය අයිතම තොග වෙළෙන්දෙකු වන **සත් බුක්ස්** ව්‍යාපාරයේ 2016 මාර්තු 01 දිනට ණයහිමි පාලන ගිණුමේ සහ ණයගැති පාලන ගිණුමේ ශේෂ පහත පරිදි විය:

| | රු. |
|---|---|
| ණයහිමි පාලන ගිණුම | 2,350,000 |
| ණයගැති පාලන ගිණුම | 1,780,000 |

2016 මාර්තු මාසය තුළ **සත් බුක්ස්** ව්‍යාපාරයේ ණයගැතියන්ට සහ ණයහිමියන්ට අදාල ගනුදෙනු පහතින් දැක්වේ:

| | රු. |
|---|---|
| ණය පදනම මත ලිපිද්‍රව්‍ය අයිතම මිලදී ගැනීම | 5,200,000 |
| ණය පදනම මත ලිපිද්‍රව්‍ය අයිතම විකිණීම | 4,800,000 |
| ණය පදනම මත මිලදී ගැනුම් ආපසු යැවුම් | 750,000 |
| ණයහිමියන්ගෙන් ලද වට්ටම් | 300,000 |
| ණයහිමියන්ට කරන ලද ගෙවීම් | 3,200,000 |
| ණයගැතියන්ගෙන් ලැබීම් | 4,200,000 |
| ලියා හරින ලද බොල්ණය | 80,000 |

**ඔබ විසින් කළ යුතු දෑ,**

**සන් බුක්ස්** ව්‍යාපාරයේ 2016 මාර්තු මාසය සඳහා පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) ණයගැති පාලන ගිණුම. (ලකුණු 02)

(b) ණයහිමි පාලන ගිණුම. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

ලාභ'ලාභ පිළිවෙලින් 3:2 අනුපාතයට, බෙදාගනිමින් **අමින්ද** සහ **දුමින්ද** යන දෙදෙනා වසර ගණනාවක සිට හවුල් ව්‍යාපාරයක නිරතව සිටි. 2016 අප්‍රේල් 01 දින **අමින්ද,** හවුල් ව්‍යාපාරයේ ගතකරනු ලබන කාලය සීමාකිරීමට තීරණය කළ අතර, ඒ අනුව, ලාභ'ලාභ බෙදා ගැනීමේ අනුපාතය පිළිවෙලින්, 1:3 ලෙස වෙනස් කිරීමට එකඟ විය.

2016 අප්‍රේල් 01 දිනට, හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමය රු.2,400,000/- ක් ලෙසට අගය කරන ලද අතර, ගිණුම් පොත්වල කීර්තිනාම ගිණුමක් පවත්වා නොගැනීමට තීරණය කරන ලදී.

**ඔබ විසින් කළ යුතු දෑ,**

හවුල් ව්‍යාපාරයේ කීර්තිනාමයේ වටිනාකම වාර්තා කිරීම සහ ලියාහැරීම වාර්තා කිරීම සඳහා (to record and eliminate) ජර්නල් සටහන් **පිළියෙල කරන්න**. (ලකුණු 05)

## 05 වන ප්‍රශ්නය

**ග්‍රීන් ස්පෝර්ට්ස් ක්ලබ්** හි 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ප්‍රකාශය පහත සඳහන් පරිදි විය:

| **ආදායම** | **රු.'000** |
|---|---|
| දායක මුදල් | 720 |
| පරිත්‍යාග | 300 |
| **මුළු ආදායම** | **1,020** |
| **අඩු කළා: වියදම්** | |
| ගෙවල් කුලී | 300 |
| වැටුප් | 140 |
| වෙනත් වියදම් | 120 |
| **මුළු වියදම්** | **560** |
| **අතිරික්තය** | **460** |

ක්‍රීඩා සමාජයේ වත්කම් සහ බැරකම් පහත සඳහන් පරිදි විය: *(රු.'000)*

| | **2015 ජනවාරි 01 දිනට** | **2015 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|
| කලින් ලැබුණු දායක මුදල් | 500 | 320 |
| හිඟ දායක මුදල් | 350 | 230 |
| ගෙවිය යුතු වැටුප් | 70 | 120 |
| බැංකුවේ ඇති මුදල් | 2,500 | ? |

**ඔබ විසින් කළ යුතු දෑ,**

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **ග්‍රීන් ස්පෝර්ට්ස් ක්ලබ්** හි ලැබීම් සහ ගෙවීම් ගිණුම **පිළියෙල කරන්න.**

(ලකුණු 05)

## 06 වන ප්‍රශ්නය

**ලක් එන්ටප්‍රයිසස්** ආයතනය එහි පැරණි බෙදාහැරීමේ වෑන් රථ වලින් එකක් විකුණා ඒ වෙනුවට අළුත් බෙදාහැරීමේ වෑන් රථයක් මිලදී ගත්තේය. ඒ සම්බන්ධ විස්තර පහතින් දැක්වේ:

(1) 2011 ජනවාරි 01 දින රු.2,500,000/- ක පිරිවැයකට මිලට ගත් පැරණි බෙදාහැරීමේ වෑන් රථය, 2016 මාර්තු 01 දින රු.700,000/- කට මුදලට විකුණන ලදී.

(2) පිරිවැය රු.3,600,000/- ක් වූ අලුත් බෙදාහැරීමේ වෑන් රථය 2016 මාර්තු 01 දින ණයට මිලදී ගත් අතර, එදින සිට එය භාවිතයට ගෙන ඇත.

**ලක් එන්ටප්‍රයිසස්** ආයතනයේ ප්‍රතිපත්තිය වන්නේ එහි මෝටර් රථ සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැයට, වර්ෂයකට 25% බැගින් ක්ෂය කිරීමයි.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2016 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළ සිදුවූ ඉහත සඳහන් ගනුදෙනු වාර්තා කිරීම සඳහා ජර්නල් සටහන් **පිළියෙල කරන්න**.

*(මුදල් ගනුදෙනු, බෙදාහැරීමේ වෑන් රථය විකිණීමේදී ඇතිවූ ලාභය / පාඩුව, මෝටර් රථ ක්ෂය ආදිය ඇතුලත්ව)* (ලකුණු 05)

*B කොටසෙහි අවසානය*

## C කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 07 වන ප්‍රශ්නය

**අනුර, බිනුර** සහ **විනුර** ලාභා'ලාභ පිළිවෙලින් 2:2:1 අනුපාතයට බෙදා ගනිමින්, හවුල් ව්‍යාපාරයක නිරතව සිටියහ.

හවුල් ව්‍යාපාර ගිවිසුමෙහි පහත සඳහන් දෑ ඇතුලත්ය:

- එක් එක් ගිණුම් වර්ෂය ආරම්භයේදී හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්වල පවතින ශේෂයන් මත, වර්ෂයකට 5% බැගින් වූ ප්‍රාග්ධන පොලියකට හවුල්කරුවන් විසින් හිමිකම් ලබයි.
- **බිනුර** වර්ෂයකට රු.75,000/- බැගින් වූ වැටුපක් ලැබීමට හිමිකම් ලබයි.

2015 අප්‍රේල් 01 දිනට, ප්‍රාග්ධන සහ ජංගම ගිණුමේ ශේෂ පහත සඳහන් පරිදි විය:

| | හර (රු.'000) | බැර (රු.'000) |
|---|---|---|
| හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්: | | |
| **අනුර** | | 4,000 |
| **බිනුර** | | 2,400 |
| **විනුර** | | 1,800 |
| හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්: | | |
| **අනුර** | | 230 |
| **බිනුර** | | 160 |
| **විනුර** | 50 | |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) 2016 මාර්තු 31 දින **විතුර** හවුල් ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කළ අතර, ඉතිරි හවුල්කරුවන් පහත සඳහන් කොන්දේසි වලට එකඟ විය:

- ලාභා'ලාභ සමසේ බෙදා ගත යුතු වේ.
- ප්‍රාග්ධනය මත පොලියත් **බිතුරගේ** වැටුපත් කිසිදු වෙනසක් නොකර, පෙර ගිවිසුමේ තිබූ ආකාරයටම ගෙවිය යුතු විය.
- කීර්තිනාමය රු.1,000,000/- ක් ලෙස අගය කළ අතර, කීර්තිනාම ගිණුමක් ඇති නොකොට හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම් හරහා එය ගැලපිය යුතු විය.
- 2016 මාර්තු 31 දිනට ජංගම නොවන වත්කම් පහත දැක්වෙන පරිදි ප්‍රත්‍යාගණනය කරනු ලැබූ අතර විස්තර පහත පරිදි වේ:

| | **2016 මාර්තු 31 දිනට ප්‍රත්‍යාගණිත අගය (රු.)** | **පිරිවැය (රු.)** | **2016 මාර්තු 31 දිනට සමුච්චිත ක්ෂය (රු.)** |
|---|---|---|---|
| ඉඩම | 3,200,000 | 3,000,000 | - |
| ගොඩනැගිල්ල | 4,250,000 | 4,500,000 | 1,000,000 |
| පිරියත | 1,000,000 | 2,500,000 | 1,250,000 |

- ජංගම නොවන වත්කම් හවුල් ව්‍යාපාරයේ ගිණුම් පොත්වල ප්‍රත්‍යාගණනය කළ අගයන් වලට පවත්වාගෙන යනු ලැබේ.
- විශ්‍රාමගන්නා හවුල්කරුට ගෙවියයුතු මුළු මුදල හවුල් ව්‍යාපාරයට දුන් ණය මුදලක් ලෙස හවුල් ව්‍යාපාරයේ තබා ගැනේ.

(2) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හවුල් ව්‍යාපාරයේ ශුද්ධ ලාභය (විසර්ජනය කිරීමට පෙර) රු.500,000/- ක් විය.

**ඔබ විසින් කළ යුතු දෑ,**

2016 මාර්තු 31 දිනට, තීරු ක්‍රමයට, පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) හවුල්කරුවන්ගේ ජංගම ගිණුම්.

(b) හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන ගිණුම්. (ලකුණු 10)

## 08 වන ප්‍රශ්නය

**සිකුරු ක්ලබ්** යනු ක්‍රීඩා සමාජයකි. ඊට අමතරව, මෙම ක්‍රීඩා සමාජය මගින් වාර්ෂිකව නාට්‍යයක් සංවිධානය කරනු ලබයි. 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සිකුරු ක්ලබ්** හි ලැබීම් සහ ගෙවීම් ගිණුම පහත පරිදි විය:

**ලැබීම් සහ ගෙවීම් ගිණුම** *(රු.'000)*

| | | | |
|---|---|---|---|
| 2015 ජනවාරි 01 දිනට ඉ/ගෙ ශේෂය | 7,500 | කාර්යාල පරිශ්‍රය සඳහා කුලිය | 3,600 |
| පරිත්‍යාග | 6,300 | නාට්‍ය නිෂ්පාදන වියදම් - 2015 | 3,800 |
| නාට්‍ය ටිකට්පත් විකුණුම් | 6,800 | නාට්‍ය සඳහා ආරාධිත කලාකරුවන්ගේ ගාස්තු | 1,200 |
| සාමාජික ගාස්තු | 50,400 | ලිපිද්‍රව්‍ය, මුද්‍රණ සහ ප්‍රචාරණ | 2,100 |
| | | වෙනත් වියදම් | 7,100 |
| | | නාට්‍යශාලා උපකරණ මිලදී ගැනීම | 15,000 |
| | | 2015 දෙසැම්බර් 31 දිනට ප/ගෙ ශේෂය | 38,200 |
| | **71,000** | | **71,000** |

2015 ජනවාරි 01 දිනට සහ 2015 දෙසැම්බර් 31 දිනට **සිකුරු ක්ලබ්** හි පැවති වෙනත් වත්කම් සහ වගකීම් පහත සඳහන් පරිදි විය:

*(රු.'000)*

| | **2015 ජනවාරි 01 දිනට** | **2015 දෙසැම්බර් 31 දිනට** |
|---|---|---|
| **වත්කම්:** | | |
| නාට්‍යශාලා උපකරණ | - | 15,000 |
| හිඟ සාමාජික ගාස්තු | 500 | 300 |
| කලින් ගෙවා ඇති කුලිය | 2,800 | 2,200 |
| **වගකීම්:** | | |
| ආරාධිත කලාකරුවන්ට ගෙවිය යුතු මුදල් | 1,200 | 1,400 |
| ගෙවිය යුතු නාට්‍ය නිෂ්පාදන පිරිවැය | 1,200 | 2,200 |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

- ලැබී ඇති පරිත්‍යාග ලැබුණ වර්ෂයේ ආදායමක් ලෙස හඳුනාගත යුතුය.
- නාට්‍යශාලා උපකරණ 2015 දෙසැම්බර් 31 දින මිලදී ගෙන ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ,**

**සිකුරු ක්ලබ්** හි පහත සඳහන් දෑ **පිළියෙල කරන්න**:

(a) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුම.

(b) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 10)

## 09 වන ප්‍රශ්නය

**ප්‍රකාශ්** ට අයිති සිනි තොග වෙළෙඳ ව්‍යාපාරයක් වන **ප්‍රකාශ් ට්‍රේඩර්ස්** හි පොත් වලින්, පහත සඳහන් තොරතුරු උපුටාගෙන ඇත.

එම ව්‍යාපාරයේ වත්කම් සහ වගකීම් පහත පරිදි වේ:

| | **2015 ජනවාරි 01 දිනට (රු.)** | **2015 දෙසැම්බර් 31 දිනට (රු.)** |
|---|---|---|
| වෙළෙඳ ලැබිය යුතු මුදල් | 2,250,000 | 1,570,000 |
| වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 1,220,000 | 3,100,000 |
| උපචිත වියදම් | 52,000 | 26,000 |
| බැංකුවේ ඇති මුදල් | 175,000 | ? |
| තොගය | 550,000 | 720,000 |

ඔහුගේ ව්‍යාපාරයේ 2015 වර්ෂය තුළ සිදුවූ ගනුදෙනු පහතින් උපුටා දක්වා ඇත:

| | **රු.** |
|---|---|
| මිලදී ගැනුම් | 26,690,000 |
| විකුණුම් | 34,100,000 |
| වෙනත් වියදම් | 2,572,000 |

**ප්‍රකාශ් ට්‍රේඩර්ස්** විසින් වර්ෂය තුළ සියලුම ලැබීම් බැංකුවේ තැන්පත් කර ඇති අතර, සියලුම ගෙවීම් බැංකු ගිණුම හරහා චෙක්පත් මගින් සිදුකර ඇත.

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) වර්ෂය තුළ බැංකුව විසින් අයකල රු.3,100/- ක බැංකු ගාස්තු පොත්වල සටහන් කර නැත.

(2) සියලුම විකුණුම් සහ මිලදී ගැනුම් ණය පදනම මත සිදු කරයි.

(3) වර්ෂය තුළ **ප්‍රකාශ්** විසින් රු.500,000/- අතිරේක ප්‍රාග්ධනයක් ව්‍යාපාරයට යොදවා ඇති අතර, ඔහු ආපසු ගැනිලි වශයෙන් රු.300,000/- ක් මුදලින් ලබා ගෙන ඇත.

(4) ප්‍රතිපත්තියක් වශයෙන් **ප්‍රකාශ්,** දේපළ, පිරියත සහ උපකරණ කිසිවක් මිලදී ගැනීම සිදුනොකරන අතර, ඒ වෙනුවට එබඳු සියලුම වත්කම් කුලී පදනම මත ලබාගෙන, එසේ ගෙවන ලද කුලී වෙනත් වියදම්වල ඇතුලත් කර ඇත.

**ඔබ විසින් කළ යුතු දෑ,**

**ප්‍රකාශ් ට්‍රේඩර්ස්** සඳහා 2015 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම **පිළියෙල කරන්න**. (ලකුණු 10)

*C කොටසෙහි අවසානය*

## D කොටස

අනිවාර්යය ප්‍රශ්නයකි.

(ලකුණු 25)

### 10 වන ප්‍රශ්නය

**සීමාසහිත බිලූකෝ (පෞද්ගලික) සමාගමේ** ගිණුම් පොත් වලින් 2016 මාර්තු 31 දිනට උපුටාගත් ශේෂ පිරික්සුම පහතින් දක්වා ඇත:

*(රු.'000)*

| | **හර** | **බැර** |
|---|---|---|
| ප්‍රකාශිත ප්‍රාග්ධනය (සාමාන්‍ය කොටස් 1,000,000) | | 35,000 |
| 2015 අප්‍රේල් 01 දිනට, රඳවාගත් ඉපැයීම් | | 15,600 |
| පොදු සංචිතය | | 7,500 |
| 10% ණයකර | | 8,000 |
| දේපළ, පිරියත සහ උපකරණ - පිරිවැයට: | | |
| ඉඩම | 43,000 | |
| ගොඩනැගිල්ල | 20,500 | |
| මෝටර් වාහන | 4,500 | |
| 2015 අප්‍රේල් 01 දිනට, සමුච්චිත ක්ෂය: | | |
| ගොඩනැගිල්ල | | 3,750 |
| මෝටර් වාහන | | 2,000 |
| 2016 මාර්තු 31 දිනට, තොගය | 6,200 | |
| වෙළෙඳ ලැබිය යුතු මුදල් / වෙළෙඳ ගෙවිය යුතු මුදල් | 5,650 | 1,880 |
| බැංකුවේ ඇති මුදල් | 950 | |
| විකුණුම් | | 25,000 |
| විකුණුම් පිරිවැය | 10,700 | |
| පරිපාලන වියදම් | 3,920 | |
| බෙදාහැරීමේ වියදම් | 2,800 | |
| ණයකර පොලිය | 400 | |
| ගෙවූ ආදායම් බදු | 110 | |
| **එකතුව** | **98,730** | **98,730** |

පහත සඳහන් අතිරේක තොරතුරු ද සපයා ඇත:

(1) දේපළ, පිරියත සහ උපකරණ සරල මාර්ග ක්‍රමය යටතේ පිරිවැය මත ක්ෂය කළයුතුව ඇත. වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය පහත සඳහන් පරිදි ඇස්තමේන්තුකර ඇත:

ගොඩනැගිල්ල : වර්ෂ 20

මෝටර් වාහන : වර්ෂ 4

(2) 2016 මාර්තු 31 දිනට පහත සඳහන් උපචිත සහ කලින් ගෙවූ වියදම් ගිණුම්ගත කළයුතුව ඇත:

| | **රු.** |
|---|---|
| කලින් ගෙවූ ගෙවල් කුලී | 25,000 |
| උපචිත විදුලිය | 8,000 |

(3) ආදායම් බදු පිළිබඳ වැඩිදුර තොරතුරු පහත පරිදි විය:

- 2015/16 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු බැඳියාව රු.250,000/- ක් ලෙස ඇස්තමේන්තුකර ඇති අතර එය ගිණුම් පොත්වල සටහන් කළයුතුව ඇත.
- මෙම ගිණුම් වර්ෂය සඳහා කරන ලද සියලුම ආදායම් බදු ගෙවීම්, ගෙවූ ආදායම් බදු ගිණුමට හරකර ඇත.
- 2014/15 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බද්ද රු.50,000/- කින් අඩුවෙන් ප්‍රතිපාදනයකර තිබූ අතර ඒ සඳහා ගැලපීම් කළයුතුව ඇත.

(4) 2016 මාර්තු 31 දිනට **පෙරේරාගෙන්** ලැබිය යුතු රු.50,000/- ක වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂය බොල්ණයක් ලෙස ලියාහැරීමට තීරණය කරන ලදී. වර්ෂ අවසානයේ පැවති ඉතිරි වෙළෙඳ ලැබියයුතු මුදල් ශේෂය මත 5% ක අඩමාන ණය ප්‍රතිපාදනයක් සැලසිය යුතුව ඇත.

(5) 2015 අප්‍රේල් 01 දින, එකක් රු.100/- බැගින් වූ ණයකර 80,000 ක් සමාගම නිකුත්කරන ලදී. සෑම වර්ෂයකම සැප්තැම්බර් 30 දිනට සහ මාර්තු 31 දිනට වශයෙන් අර්ධ වාර්ෂිකව (by-annually) පොලී ගෙවිය යුතුය. කෙසේවෙතත්, 2016 මාර්තු 31 දිනෙන් අවසන් අර්ධ වර්ෂයේ පොලිය සඳහා වන චෙක්පත නිකුත්කොට තිබුණේ 2016 අප්‍රේල් 01 දිනදීය.

(6) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභයෙන් සාමාන්‍ය කොටසකට රු.5/- බැගින් වූ අවසාන ලාභාංශයක් ගෙවීමට 2016 අප්‍රේල් 10 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

(7) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා අනුමැතිය දෙන ලද්දේ 2016 මැයි 05 දිනය.

**ඔබ විසින් කළ යුතු දෑ,**

**සීමාසහිත බිලූකෝ (පෞද්ගලික) සමාගමේ,** කළමනාකරණයේ භාවිතය සඳහා පහත සඳහන් දෑ **පිළියෙළ කරන්න**:

(a) 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය. (ලකුණු 12)

(b) 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 13)

(මුළු ලකුණු 25)

*D කොටසෙහි අවසානය*

# කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>**අවබෝධය**<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාල කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාල කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාළ කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>**භාවිතය**<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රයෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>**විශ්ලේෂණය**<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |